# ආයුබෝවන්

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍ර අන්තර්ගතය විමර්ශනය කිරීම

## 2-කොටස

5-ශ්‍රේණිය
සාධනය අඩු දරුවන්
ප්‍රවර්ධනය කිරීමේ
වැඩමුළුව ඇසුරින්

*Jayasinghe*

# Nerec අධ්‍යාපන අනාවරණ,
# 5 ශ්‍රේණිය,
# ශිෂ්‍යත්ව පරීක්ෂණ ඇසුරින්

**එක් පළාතකින් පාසල් 50 බැගින් දිවයිනෙන් පාසල් 450 මෙම නියදි සමීක්ෂණයට යොදාගෙන ඇත.**

# • අරමුණු

- විභාගය සම්බන්ධ පසු විපරමක්/ අධ්‍යනයක්
- අවුරුදු හතරක් තුළ දරුවා සිටින තැන හඳුනාගැනීම
- අපේක්ෂිත මට්ටමට ළඟාවී ඇද්දැයි සොයා බැලීම
- දුබලතා හා ප්‍රබලතා හඳුනාගැනීම
- ශිෂ්‍ය සාධනයේ විෂමතා සොයාබැලීම
- පංති කාමර ඉගෙනුම් කටයුතු ඇගයීම
- ඉගෙනුම් ක්‍රියාවලියේ කළ යුතු වෙනස්කම් හඳුනාගැනීම
- ඉදිරි පෝෂණ අවශ්‍යතා තීරණය කිරීම
- ප්‍රතිපෝෂණ අව්‍යතා හඳුනාගැනීම
- ශිෂ්‍යත්වයෙන් බලාපොරොත්තු වන්නේ හොඳ සාධන මට්ටමක් (ල-70 වැඩි) අගයක්
- සිසුන් තේරීමේ පරීක්ෂණයක් වීම හා එහි ගුණාත්මකව ඇගයීම

# •මව් බස

- අක්ෂර වින්‍යාසය අඩු සාධන මට්ටමක පැවතීම
- ස්පිලි-පාපිලි යෙදීම හා දීර්ග කිරීමේ ගැටළු ඇත
- අභියෝගාත්මක ප්‍රශ්න මගහැර ඇත
- නිවැරදි සංකල්ප දරුවන් තුළට ගොස් නැති බව
- කට පාඩම් කළ රචනා වැකි ලියා ඇත
- අනුපිළිවලින් ගලපා ලිවීමේ වාක්‍ය, නොගැලපීම
- උක්තාඛ්‍යාත  පද නෙවරදි නොවීම
- කාලයට අනුව වාක්‍ය ගලපා නැත
- වාක් කෝෂය තුළ නිර්මාණාත්මක ලේඛනයට හුරුවීමේ අඩුවක් ඇත
- වාක්‍යයේ වචන වැඩිකිරීමට යාම තුළ වැරදි වැඩිකරගෙන තිබීම
- ජේදයෙන්ම පිළිතුරු සෙවිමට ඇති නොහැකියාව
- අදාළ පරිදි ලිවිමේ පැවරුම් ලබාදීම වැදගත්ය

- **ගණිතය**
- සංකල්ප සාධනය සිදු නොවීම
- සංකල්ප සරල ක්‍රම මගින් පැහැදිලි කළ යුතුයි
- මව් භාෂාවේ සාක්ෂරතාවය අඩුකම
- නාගරික පාසල් වලට වඩා ග්‍රාමීය පාසල් වල ගැටළු උග්‍රය
- බුද්ධිමය ගැටළු විසදීමේ දුර්වලතා තිබීම
- ස්ථානීය අගය පිළිබඳ දැනුම අඩු බව
- දීර්ග වාක්‍යවලට දරුවන් බිය බව
- රූප සටහන් සහිත ගණිත කර්ම මගහැරීම
- ගුණ කිරීම-බෙදීම වැනි ගණිත කර්මවල පිළිතුරු නිවැරදි නැත
- **දැලිස වැඩ සටහන ක්‍රියාත්මක කිරීම වැදගත්ය**

- **පරිසරය**
- පරිසර විෂයට ලකුණු 30 ඉක්මවා වෙන්කර ඇත
- සාක්ෂරතාවයේ ගැටළුව එලෙසින්ම පැවතීම ගැටළුවකි
- පශ්න අවබෝධ කරගැනීමේ අඩු පාඩු ඇත
- දරුවෝ සංකේත වලට බයයි
- රූප සටහන් සහිත ප්‍රශ්න වලට බයයි
- සරල කවි කියවා අවබෝධ කරගැනීමේ දුර්වලතා ඇත
- දරුවා දැනුමෙන් පමණක් නවතා තැබීම ගැටළුවකි
- ගුරුවරයා ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීම ගැටළුවකි
- නිපුණතා කෙරෙහි අවධානය යොමු නොකර තිබීම ගැටව උග්‍ර කරයි

- ඉංග්‍රීසි - දෙමළ
- English ගුරුවරු උගුව පළාතට අවශ්‍ය ප්‍රමාණයට ඇත
- Capital/simple අක්ෂර කවලමේ ලියා තිබීම
- අක්ෂරවල නෙවරදි සවරූපය නොතිබීම
- වචනවල අක්ෂර නෙවරදි නොවීම
- වාචික ඉංග්‍රීසි පංති කාමරයේ භාවිතා නොකිරීම
- විරාම ලක්ෂණ නෙවරදිව භාවිතා නොකිරීම
- වචනණිඅක්ෂර නෙවරදිව වෙන් නොකර ලිවීම
- Blooming Budts වැනි වැඩසටහන් කියාත්මක කළ යුතුය
- ත්‍රී භාෂා වැඩ සටහන් ක්‍රියාත්මක තලයට ගෙන ඒම වැදගත්ය

**සැමට අධ්‍යාපන ශාඛාව විසින් සිදුකළ සොයාබැලීම අනුව හඳුනාගත් දරුවන් අධ්‍යාපනයෙන් බැහැර වීමට හේතු වන බාධක :***

1* පාසලේ උගන්වන දෑ දරුවන්ට තේරුම් ගැනීමට අපහසු බව දෙමව්පියන්ගෙන් 60% ක් පවසයි

2* ඉගෙනීමේදී තමාට නොතේරෙන බව සිසුන්ගෙන් 42% පවසයි

3* සුහග දරුවන් පමණක් ඉලක්කකර ඉගැන්වීම ගැටළුවක් බව 70% දෙමව්පියන් පවසයි

4* ගුරුවරුන්ගේ දඬුවමට බිය බව සිසුන් 78% ක් පවසයි

5* පාසලේදී දෙන ගෙදර වැඩ තේරුම් ගැනිමට අපහසු බව සිසුන් 50% ක් ප්‍රකාශ කරයි

6* නොපැමිණි දිනවල උගන්වන පාඩම් ග්‍රහණය කරගැණීමට අපහසු බව ගුරුවරුන්ගෙන් 21% පවසයි

7* දරුවන් 97% ක් කුමන හෝ දුෂ්කරතාවයකින් පෙළෙන බව ගුරුවරු පවසයි

8* එවැනි සිසුන්ට ඉගැන්වීම සඳහා සහය/පුහුණුව අවශ්‍ය බව 100 %ක් ගුරුවරු පවසයි

- යම් නිපුණතාවයකින් ප්‍රවීණත්වයට පැමිණි සිසුවෙකු තුළ දැකියහැකි ලක්ෂණ :- (එම නිපුණතාවයට අදාළව)
  - ඊළඟ මට්ටමට යොමු වීමට සූදානම් බව පෙන්නුම් කරයි
  - තව දුරටත් ඉගෙනීමට පෙළඹවීමක් පෙන්නුම් කරයි
  - ආත්ම විශ්වාසයක් ඇති බව පෙන්නුම් කරයි
  - තවත් අයෙකුට ඉගැන්වීමට හැකි බව ප්‍රදර්ශනය වේ
  - එම නිපුණතාවයට උනන්දුවක් ඇති බව ප්‍රදර්ශනය වේ
  - ගැටළුවක් ඇති විට ස්වාදීනව විසදාගනු ලබයි
  - එම නිපුණතාවයට අදාළ කාර්යන් නිවැරදිව කරයි
  - ආකල්ප වලට අදාළ නිපුණතාවයක් සම්බන්ධ චර්යා නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරයි
- නිපුණතාවයක ප්‍රවීණත්වය තහවුරු කිරීමේදි ඉගෙනුම් ක්‍රියාවලිය තුළදීම, තක්සේරු වාර්තාවල සත්‍ය තොරතුරු වාර්තා කරන්න

# •අවධානයට ගන්න

- ප්‍රශ්න පත්‍ර සකස් කිරීම අත්‍යවශ්‍ය ඉගෙනුනිපුණතා වලට අදාළවම සිදුවන බව
- දක්ෂ සිසුන්ගෙන් අති දක්ෂ සිසුන් වෙන්කර ගැනීම සඳහා ප්‍රශ්න කීපයක් යොදා ගන්නා බව
- තක්සේරුකරණය මුල සිටම වෙලා නැති බවත් ඒ සඳහා ප්‍රතිපෝෂණ ද ක්‍රියාත්මක කළ යුතු බව
- ඉගෙනුම් ඵලයට ඒම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් පංති කාමරයෙන් ඔබ්බට ගෙනයා යුතු බව
- එහිදි ඉගෙනුම් ක්‍රියාකාරකම් කුඩා කොටස් වලට කඩාගෙන ක්‍රියාකාරකම් හඳුන්වාදීමණිභාවිතය ණි ඇගයීමණිප්‍රතිපෝෂණය ණිඉදිරි පෝෂණය සිදුකිරීම වැදගත් බව
- ළගම පාසල - හොඳම පාසල යටතේ ජනප්‍රිය පාසල් ඇතිවන නිසා දෙමාපියන් පෙළඹවීමෙන් වැලකීම වැදගත් බව
- වෙනත් පොත්පත් හා අසාදු ලේඛනවලින් දරුවාට වන පීඩාව නැති කිරීම හා මේ පිළිබඳ දෙමාපියන් දැනුවත් කළ යුතු බව
- අංක 01 ට සිදුවන ශිෂ්‍යත්ව බිස්නස්එක නතර කරණි දරුවා පීඩනයෙන් මුදවාගත යුතු බව
- දරුවාට නිපුණතා වලින් පිරි කුසලතා පූර්ණ අද්දැකීම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදීම ලබා දෙන්න කටයුතු කළ යුතු බව

- **I-පත්‍රයෙන්** ඉගෙනුම් හැකියා සහිත විභව්‍යතා මාන 14 ක් මැනීම හා ඒ සඳහා ප්‍රශ්න 40 ක් යොදා ඇත
- **II-පත්‍රය** සඳහා 1-5 වසර තෙක් පන්ති කාමරයේ ක්‍රියාකාරකම් හා විෂය නිර්දේශ තුළින් ලබා ගත් අත්දැකීම් නිසා ප්‍රායෝගිකව වර්ධනය වන කුසලතා මැනීම සඳහා ප්‍රශ්න 60 ක් යොදා ඇත
- නමුත් දරුවන් II-පත්‍රයට මෙන්ම I-පත්‍රයට ලකුණු ලබා ගැනීමේ ප්‍රතිශතාත්මක අගය අඩු බවක් පෙන්නුම් කරයි
- II-පත්‍රය, ගුරුවරයාගේ ඉගෙනුම් ක්‍රියාවලිය නිරූපනය කරන බැවින් එය ඉහළ ප්‍රතිශතයක් ගැනීම වැදගත්ය
- මෙසේ නොවීමට හේතුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සංකල්ප අවබෝධ කිරීමට යොදා ගන්නා ක්‍රමයේ දුර්වලතාවය ලෙස හඳුනාගතහැකිය
- මේ නිසා ගුරුවරයාගේ ක්‍රියාවලිය, භූමිකාව වෙනස්විය යුතුය

## යම් නිපුණතාවයකින් ප්‍රවීණත්වයට පැමිණි සිසුවෙකු තුළ දැකිය හැකි ලක්ෂණ :-

## (එම නිපුණතාවයට අදාළව)

- ඊළඟ මට්ටමට යොමු වීමට සූදානම් බව පෙන්නුම් කරයි
- තව දුරටත් ඉගෙනීමට පෙළඹවීමක් පෙන්නුම් කරයි
- ආත්ම විශ්වාසයක් ඇති බව  පෙන්නුම් කරයි
- තවත් අයෙකුට ඉගැන්වීමට හැකි බව ප්‍රදර්ශනය වේ
- එම නිපුණතාවයට උනන්දුවක් ඇති බව ප්‍රදර්ශනය වේ
- ගැටළුවක් ඇති විට, ස්වාදීනව විසදාගනු ලබයි
- එම නිපුණතාවයට අදාළ කාර්යන් නිවැරදිව කරයි
- ආකල්ප වලට අදාළ නිපුණතාවයක් සම්බන්ධ චර්යා නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරයි

**නිපුණතාවයක ප්‍රවීණත්වය තහවුරු කිරීමේ දි ඉගෙනුම් ක්‍රියාවලිය තුළදීම, තක්සේරු වාර්තාවල සත්‍ය තොරතුරු වාර්තා කරන්න**




- පුන් කළස් මත
පහන් දැල් වු විලසට
මතු දිවියට
පැටවුන්ට අපේ ,
නොනිමි පහනක් වන්න
හෙට දිනට---!!

Jayasinghe (i.s.a),
D.E.O, Rideemaliydda,
Mahiyanganaya.